# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# නර්තනය
# 7 ශ්‍රේණිය



### අධ්‍යාපන සංවර්ධන අංශය

### කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**


අනෝමා කහඳවආරච්චි - ගුරු උපදේශක

කෞශල්‍යා තත්සරණී මුණසිංහ-නර්තන ගුරු(බප/කැල බියගම ම.ම.වි)

**සියලු හිමිකම් ඇවිරිණි**

## පාඩම:-01

## ❖ උත්සාහය නැමැති ස්ථායි භාවය ප්‍රදර්ශනය කරමු.




1. භාව නිරූපණය කෙරෙන නර්තන නිර්මාණ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී භාව ප්‍රකාශනය වැදගත් වේ.
2. අංග ප්‍රත්‍යාංග උපාංග යොදා ගනිමින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වේගය, බර,සැහැල්ලු බව,කාලය,දුර පිළිබඳව අවධානය යොමු කළ යුතු බව.
3. උත්සාහ නැමැති භාව නිරූපණය ඉදිරිපත් කිරීමේ දී ශරීරයේ;

   - මස් පිඩු තද කිරීම,තොල් තදින් හකුලා ගැනීම,ඇස් කුඩා කිරීම,දත් ඇදි එකට තද කිරීම,කම්මුල් දෙපසට විහිදීම ආදී චලන සිදු වේ.

4. උත්සාහය නැමැති භාවය ප්‍රදර්ශනය කළ හැකි අවස්ථා;

   - බර එසවීමකදී,කඹ ඇදීමේදී,තරග අවස්ථාවකදී,පුද්ගලයකු වලට වැටී ගොඩ ඒමේ දී, දැල් ඇදීමේදී.......මේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී උත්සාහය නිරූපණය වන අතර උපදින රසය වන්නේ වීර රසයයි.

**පැවරුම:-**

- උත්සාහය නැමැති ස්ථායි භාවය ප්‍රදර්ශනය කිරීමට සුදුසු සිද්ධියක් ගොඩනගන්න.

**පාඩම:-02**

## ❖ ජන ගායනාවල සමාජයීය හා සංස්කෘතික පසුබිම හඳුනාගනිමු.

**<u>මල් යහන් කවි</u>**



මල් යහන් කවි ගායනය අසන්නට ලැබෙන අවස්ථා;

- මල් යහන් කවි ගායනා කිරීමේ අරමුණ වන්නේ දෙවියන්ගේ පිහිට ලබා ගැනීම සඳහා ය.
- මල් යහනට වඩින ලෙස ආරාධනා ස්වරූපයෙන් ගායනා කරනු ලබන ගී විශේෂය වන්නේ මල් යහන් කවි ය.
- උඩරට පහතරට සබරගමු යන ත්‍රිවිධ සම්ප්‍රදායන්හිම මෙම ගායන විශේෂ යොදා ගනු ලබයි.
- ප්‍රාදේශීය විවිධත්වය අනුව පුද ලබන දෙවියන් මුල්කොට කවි ගායනා කරනු ලබයි.
- සම්ප්‍රදාය අනුව ගායනාවල නාද මාලාවන් ගේ වෙනසක් දැකිය හැකිය.



**<u>මල් යහන් කවි</u>**

මිහින්තලය  අටසැට ලෙන සේල චෛත්‍ය වෙහෙරට
අඹතලාව මිරිස වැටිය භයා ගිරිය නම් වෙහෙරට
ජය ශ්‍රී මහා රුවන්වැලිය ථූපාරාමය වෙහෙරට
අටමස්ථානයේ සිටියත් වඩින්න දෙවි මල් යහනට

පුටුව සරසලයි මම සැල කරන්නේ - පුටුවෙ තියෙන දලු බුලතුයි පුදන්නේ
කැටුව සිවුවරම් සමගින් බලන්නේ - ශ්‍රියා දේවි මල් අස්නට වඩින්නේ

## පැවරුම:-

- ඉහත කවි වල දැකිය හැකි භාෂා ලක්ෂණ ලියන්න.
- ආගමික ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා දැක්වෙන කවි පද ලියා දක්වන්න.
- මෙම කවි ගායනා කිරීමට උත්සාහ ගන්න.

**පාඩම:-03**

## ❖ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම හඳුනාගනිමු. (උඩරට කොහොඹා යක් කංකාරිය)

**ශාන්තිකර්ම යනු,**කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභසිද්ධිය අරමුණු කොට දෙවියන් යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

දේශීය නර්තන සම්ප්‍රදාය තුනට අයත් ශාන්තිකර්ම.

| සම්ප්‍රදාය | ශාන්ති කර්ම |
|---|---|
| උඩරට නර්තන සම්ප්‍රධාය | කොහොඹා කංකාරිය |
| පහතරට නර්තන සම්ප්‍රධාය | දෙවොල් මඩු ශාන්ති කර්මය |
| සබරගමු නර්තන සම්ප්‍රධාය | පහන් මඩුව ශාන්ති කර්මය |







## ශාන්ති කර්ම පැවැත්වීමට හේතු වූ කරුණු:-

**උඩරට කොහොඹා කංකාරිය ශාන්ති කර්මය**

අතීතයේ පැවැත්වීමට හේතුව

+පඬුවස් දෙව් රජුට වැදුණු දිවි දොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම.

වර්තමානයේ පැවැත්වීමට හේතුව

+ධන,ධාන්‍ය ගව මහීෂාදීන් භව බෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම.

+පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුව කර ගැනීම.

+ගමකට ප්‍රදේශයකට මුළු රටටම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම.

+අධ්‍යාපනික අවශ්‍යතා. (අධ්‍යයන හා පර්යේෂණ සඳහා)

## ශාන්ති කර්මයේ පුද ලබන දෙව්වරු:-

- කොහොඹා දෙවියෝ, අලුත් කොහොඹා, මහා කොහොඹා, පරණ කොහොඹා යන කොහොඹා දෙව් තුන් කට්ටුව

### කොහොඹා කංකාරිය පුරාවෘත්තය:-

විජය රජු කුවේණිය සරණ පාවා ගෙන වාසය කිරීමේ දී ඔහුට ජීවහත්ත සහ දිසාලා නම් දරු දෙදෙනා උපදිති .ඉක්බිති ඔහු කුවේණිය පලවා හැර මදුරාපුරයෙන් ගෙන්වා ගත් සමකුල කුමරියක සරණ පාවා ගනී .විජය රජු කෙරෙහි කෝපයට පත් කුවේණිය ඔහුට ශාප කළාය.විජයගේ ඇවෑමෙන් රජ පැමිණි පඬුවස්දෙව් රජුට කුවේණිය විසින් විජය රජුට කරන ලද ශාපය වැදිණි.

සිහිනෙන් දිවි වෙසක් දැක බියපත් වූ පඬුවස් දෙව් රජු බලවත් සේ රෝගාතුර විය. කොහොඹාකංකාරියේ දිවි දෝශය නමින් හැඳින්වෙන්නේ මෙයයි ,මෙම දිවි දෝශය දුරු කිරීම සඳහා නොයෙකුත් සෙත්ශාන්ති කරවන ලද නමුත් සුවයක් නො ලැබිණි ‘අනතුරුව ශක්‍රදේවේන්ද්‍රයා ට මෙය සැලකර සිටියේය. දිවියෙකු සිහිනෙන් දැක බිය වීමෙන් හටගත් රෝගයක් හෙයින් මවු කුසෙන් උපන් කෙනෙකුට දුරු කළ නොහැකි නිසා මලෙන් උපන් කෙනෙකු සොයා යාගය කරන ලෙස උපදෙස් දෙන ලදී .

මෙම කාර්‍යය රාහු අසුරේන්ද්‍රයාට භාර කරන ලදී.රාහු අසුරේන්ද්‍රයා විෂ්ණු දෙවියන්ගේ දස අවතාර වලින් එකක් වන දියෙන් ගින්නෙන් ආයුධ වලින් හෝහීයකින් නො නස්නා බල ඇති ඌරු අවතාරය ලබා දෙන්නේ නම් කාර්ය භාර ගන්නා බව කියා සිටියේය.අවසරය ලැබුණු රාහු අසුරේන්ද්‍රයා සත් මුහුදෙන් එතෙර වී මලය රටට ගොස් රජුගේ නන්දන උයන විනාශ කරන්නට පටන් ගති. උයන ආරක්ෂා කරන උයන් පල්ලා සිදුව ඇති විපත මලය රජුට දැන්වීය .රජු ඌරා ඇල්ලීම සඳහා නුවර අණබෙර ලවා වැදි සේනාව රැස්කර උයන වට කළේය ඌරා මලය රජුගේ නුවරට වැදඌරා මාළිගා බිඳ දුවන විට මලය රජු, කිත්සිරු, සදළිදු ,යන තුන් දෙන අතින් දුනු හී ගෙන ඌරා ලුහුබැඳ ලක්දිව පැමිණියේය.සත් මුහුද පීනා ගිය ඌරා ලක්දිවට පැමිණ හන්තාන කන්ද අසල දී ගලක් බවට පත්වි මලය රජු කඩුවෙන් කොටා විස්මයට පත් වූ අවස්ථාවේ එතැනට පැමිණි සක් දෙව් රජු මලය රජු ඇතුළු පිරිස මෙහී ගෙන්වීම පිණිස මෙවැනි මායාවක් කළ බවක් විස්තර කළේය .මලය රජු ඇතුළු පිරිස පඬුවස්දෙව් රජුගේ දිවිදොස් සුවපත් කිරීම පිණිස අනුරාධපුරයේ මහමෙවුනා උයනේ නියමිත දිග පළල සහිත මණ්ඩපයක් කරවා ශාන්තිකර්මය කිරීමෙන් අනතුරුව දිවි දෝෂය සුවපත් විය.

## ශාන්තිකර්ම හා සබැඳි නර්තනය ගායනය වාදනය චාරිත්‍ර විධි සහ සැරසිලි.

### චාරිත්‍ර විධි:-

- කප් සිටුවීම, මඩුව සෑදීම, මඩු පේ කිරීම, තොට පේ කිරීම, මල පේ කිරීම, ආභරණ වැඩමවීම, මල් යහන් කවි හා දෙවියන් පේ කිරීම.

**නර්තන අංග:-**

- යක්ඇන්නුම, අස්නෙ, ආවැන්දුම, හත් පද, දුනුමාලප්පුව, කොහොඹා හැල්ල, යක්තුන් පදය, හත් පදය, දාන පහ, මඩුපුරය.

**ගායනය:-**

- නමස්කාර අෂ්ඨක, ශ්ලෝක, සන්න, සැහැලි, යාදිනි, සිරසපාද, කඩතුරා, කෝල්මුර, උපත් කවි.

**වාදනය:-**

- නර්තනය සඳහා කෙරෙන වාදනය, ගායනය සඳහා පමණක් පමණක් යෙදෙන වාදනය, මගුල් බෙර වාදන, පිං බෙර, වැඩුම් අත්, දැකුම් අත්, වාදනය.

**සැරසිලි:-**

- මඩුව වටා ගොප් කොළ සැරසිලි වලින් අලංකාර කරනු ලැබේ. මඩු සැරසීම, අයිල මල් යහන්, පිදේනි තටු සැකසීම සඳහා ද සැරසිලි යොදා ගනු ලැබේ. පොදුවේ ගත් කල කෙසෙල් පතුරු ගොක්කොළ අමුද්‍රව්‍ය ලෙස යොදා ගනී. ලී කෝටු, පට්ටා, කෙසෙල් කොළ, හබරල කොළ ද භාවිත කරයි. රංග භාණ්ඩ නිර්මාණය ද සැරසිලි වලට අයත් වේ. පොදුවේ ගත්කල පරිසරයෙන් ලබා ගන්නා ලද ස්වභාවික අමුද්‍රව්‍ය සැරසිලි සඳහා යොදා යොදාගනු ලැබේ.

**නාට්‍යමය අවස්ථා:-**

- යක්කම්, ගුරුගේ මාලාව, ගබඩා කොල්ලය.

## පැවරුම:-

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**.
    1. ශාන්ති කර්ම යනු කුමක්දැයි විස්තර කරන්න.
    2. ශාන්තිකර්ම පවතින ප්‍රදේශ නම් කරන්න.
    3. ශාන්ති කර්මය පැවැත්වීමේ හේතු ඉදිරිපත් කරන්න.
    4. කතා ප්‍රවෘත්තිය හා බැඳි චරිත නම් කරන්න.
    5. පුද ලබන දෙවිවරු නම් කරන්න.
    6. නර්තන ගායන හා වාදන අංග දෙක බැගින් නම් කරන්න .
    7. ශාන්ති කර්මයක දක්නට ලැබෙන සැරසිල්ලක් නම් කරන්න.
    8. ඉගෙන ගන්නා සම්ප්‍රදාය හා සබැඳි ශාන්තිකර්ම පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
    9. ශාන්ති කර්මයට අදාළ පින්තූර එකතු කර ගනිමින් කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න.

## පාඩම:-04

# ❖ දේශීය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන්

## ජේ.ඊ. සේදරමන් මහතා

- 1908.09.23 උපත ලද ජේ.ඊ. සේදරමන් මහතා ප්‍රවීණ උඩරට නර්තන ශිල්පියෙකි.
- මහනුවර පූජාපිටිය මහ විද්‍යාලයයෙන් මූලික අධ්‍යාපනය ලබා ඇත.
- පියා වූ මාදන සිරිසේන ගුරුතුමාගෙන් උඩරට නර්තනය, බෙර වාදනය, චිත්‍ර ශිල්පය, මූර්ති ශිල්පය, නක්ෂත්‍රය ආදියත් පන්සල ආශ්‍රයයෙන් සිංහල, පාලි හා සංස්කෘත භාෂාව සහ කාව්‍යකරණයත් උගත් මෙතුමා දක්ෂ කලාකරුවෙකි.

### විදේශ සංචාර සහ ඉදිරිපත් කරන ලද නර්තන:-

- 1930 වර්ෂයේ දී ප්‍රංශය බලා පිටත් ව ගිය ඔහු එහි දී සර්කස් කණ්ඩායමකට බැඳී නර්තනයක් ඉදිරිපත් කර ඇත. ජර්මනිය, බෙල්ජියම, ස්විට්සර්ලන්තය, හංගේරියාව, ඉතාලිය සහ එංගලන්තය වැනි රටවල ද සංචාරයේ යෙදෙමින් නර්තන ඉදිරිපත් කර ඇත.
- එංගලන්ත සංචාරයේ දී රාගිනි දේවිය සමඟ රාධා ක්‍රිෂ්ණ නර්තනය සහ නාග නර්තනය ඉදිරිපත් කිරීමට මෙන් ම ඇයගේ නර්තන වැඩ සටහන්වල නර්තන අංග හයක් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලැබී ඇත. ඔහු විසින් ලියන ලද ''සුන්දර යුරෝපය'' නම් කෘතියේ රාවණ නෘත්‍යයක් ද ඉදිරිපත් කර ඇති බව සඳහන් වෙයි.

### අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා ඉටු කර ඇති සේවය:-

- 1941 ජුනි 01 දින ගුරුවරයකු ලෙස මුල් ම පත්වීම ලබා ගනිමින් මාවතගම මහා විද්‍යාලයයේ උඩරට නර්තනය විෂයයක් ලෙස ඉගැන්වීම.
- ගිරාගම, පේරාදෙණිය, පොල්ගොල්ල, මීරිගම, නිට්ටඹුව යන ගුරු අභ්‍යාස විද්‍යාලයවල නැටුම් සහ සංගීත පරීක්ෂකවරයකු ලෙස සේවය කිරීම.
- ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයයේ නැටුම් හා සංගීත කථිකාචාර්යවරයකු ලෙස සේවය කිරීම.

### රචනා කරන ලද ග්‍රන්ථ:-

- සිංහල නාට්‍ය කලාව - 1944
- නෘත්‍ය චින්තාමණි - 1949
- උඩරට නැටුම් කලාව - 1962
- නෘත්‍ය රත්නාකරය – 1959
- ලංකාවේ යක්ෂ යුගය හෙවත් කොහොඹා කංකාරි
- උපත - 1955
- ශුභ ශාන්ති විධි නොහොත් ලංකාවේ බලි උපත- 1964
- බලියාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත-1967

### නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය කෘති:-

- පණ්ඩුකාභය, තේලපත්ත, විජය කුවේණි

### කලාත්මක කටයුතු සඳහා පිහිටුවන ලද සංවිධාන:-

- ලංකා මහජන කලා මණ්ඩලය, රාවණ කලා සංගමය

## එම්.එච්. ගෝමිස් මහතා

- පහතරට නර්තන සම්ප්‍රදායයේ මාතර ශෛලියේ නර්තන ශිල්පියකි.
- රටයකුම හෙවත් රිද්දි යාගය, සූනියම් කැපිල්ල, මහසොහොන් සමයං වැනි ශාන්තිකර්ම පිළිබඳ පුළුල් දැනුමක් සතු ප්‍රවීණ ශාන්තිකර්ම ඇදුරකුි.
- ගෝමිස් මහතා පහතරට සුවිශේෂ නර්තන අංග වන නාගකන්‍යා, ගිනි සිසිල, පන්දම් පාලිය වැනි නර්තන අංග ඉතා ම සිත් ගන්නාසුලූ ආකාරයට නිර්මාණය කරමින් වේදිකාවට උචිත ලෙස රංග වින්‍යාසය සිදුකරන ලදී.
- පහතරට නර්තනය වේදිකාවට උචිත ලෙස සකස් වී නොතිබුණු අවධියක ඒවා ක්‍රමවත් ව ඉදිරිපත් කිරීම.
- ලෝකයේ රටවල් ගණනාවක ම තමන්ගේ නර්තන හැකියාවන් ප්‍රදර්ශනය කිරීම සහ අන්තර්ජාතික වශයෙන් සම්මානයට පාත්‍ර වීම.
- සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස වසර ගණනාවක් සේවය කර ඇත.

# රද්දැල්ලේ පොඩි මහත්මයා මහතා



- සබරගමු නර්තන ශිල්පියකු ලෙස කටයුතු කළ රද්දැල්ලේ පොඩි මහත්තයා (පරංගියා වත්තේ පොඩිමහත්තයා)ශිල්පීය ඥානය ලැබුවේ පියාගෙනි.
- 1947 වර්ෂයේ දී සබරගමු නර්තනය ඉගැන්වීමට සබරගමු කලායතනයක් ආරම්භ කරන ලදී.
- 1959 වර්ෂයේ දී දික්වැල්ල මහා විද්‍යාලයයේ නර්තන ගුරුවරයකු ලෙස පත්වීම.
- 1964 දී ගිරාගම ගුරු විද්‍යාලයයේ කථිකාචාර්යවරයකු ලෙස පත්වීම.
- 1977 - 1990 දක්වා සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කළ එතුමා සබරගමු නර්තන විෂයමාලා සකස් කිරීමට මූලිකත්වයක් ලබා දෙන ලදී.
- රද්දැල්ලේ පොඩි මහත්තයා කථිකාචාර්ය තුමා සබරගමු නර්තනයටත්, ගායනයටත්, දවුල් වාදනයටත් එක හා සමාන දක්ෂතාවක් දැක්වූ කලා ශිල්පියෙකි. මෙතුමා නර්තන නිර්මාණයට සුවිශේෂ දක්ෂතාවක් දැක්වී ය.
- පාසලට, ගුරු විද්‍යාලයයට, විශ්වවිද්‍යාලයයට පමණක් එතුමා සේවය සීමා කළේ නැත. ලැබෙන සෑම අවස්ථාවක ම පහන් මඩු, ගම්මඩු ශාන්තිකර්මවලත් නර්තන

**පැවරුම:-**

- **වගුව ඇසුරු කර ගනිමින් හිස්තැන් පුරවන්න.**

| **ශිල්පීන්ගේ නම්** | **අයත් සම්ප්‍රදායය** | **ශිල්පීය දක්ෂතා** | **නර්තන කලාවට සිදු වූ සේවාව** | **නිර්මාණය කරන ලදකලා කෘති** |
|---|---|---|---|---|
| | | දවුල් වාදනය | | |
| | පහතරට නර්තන සම්ප්‍රදායය | | නර්තනකථිකාචාර්යවරයකු හා ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස සේවය කිරීම | |
| ජේ.ඊ. සේදරමන් | | | | උඩරට තාල ශාස්ත්‍රය |

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. ජේ.ඊ. සේදරමන් මහතා නර්තන අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා ඉටු කර ඇති සේවය පිළිබඳ විස්තර කරන්න.
2. එම්.එච්. ගෝමිස් මහතා විසින් වේදිකාවට උචිත ලෙස නිර්මාණය කරන ලද සාම්ප්‍රදායික නර්තන 3 ක් ලියන්න.
3. පරංගියා වත්තේ පොඩිමහත්තයා යන නාමයෙන් හඳුන්වන ලද නර්තන ශිල්පියාගේ නම ලියන්න.

## පාඩම:-05

## ❖ කතරගම දේවාල පෙරහැර



- කතරගම දේවාල පෙරහැර සිංහල, හින්දු, මුස්ලිම්, ආදිවාසීන් ආදි සියලූ ජනයාගේ ආගමික පෙරහැරක් ලෙස හැඳින්වේ.

### පෙරහැර පැවැත්විමේ අරමුණු:-

බැතිමතුන්ගේ අපල උපද්‍රව දුරු කිරීම.

දේවාශීර්වාදය ලැබීම හා රටට සෙත්පැතීම.

වර්ෂාව හා සශ්‍රීකත්වය ලබා ගැනීමට.

ස්වාභාවික විපත්වලින් රට බේරා ගැනීම.

### පෙරහැර පැවැත්වෙන කාලය:-

කප් සිටුවීමෙන් දින 44ක් ගෙවුණු තැන දී එළඹෙන අමාවක ගෙවී, පුර පෑළවිය දිනයේ පුස නැකතින් කතරගම දේවාලයයේ පෙරහැර ආරම්භ වේ. ඇසළ මාසයේ මංගල්‍යය පැවැත්වෙන මුළු කාලය තුළ ම කතරගම දෙවියන් මිනිස් ලොවට පැමිණ සිටුවන ලද කපෙහි වාසය කරන බවට විශ්වාසයක් පවතී. එ නිසා සිටුවන ලද කප් පූජා වස්තුවක් ලෙස සලකනු ලැබේ.

## කතරගම පෙරහැර හා බැඳි චාරිත්‍ර:-



කතරගම දේවාලයයේ සාම්ප්‍රදායික වශයෙන් වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍ය උත්සව තුනකි.

1. අවුරුදු මංගල්‍යය
2. ඇසළ උත්සවය
3. ඉල් මහ මංගල්‍යය වශයෙනි.

ගිනි පෑගීම, බිම පෙරළීම, කටු ගැසීම ආදි දුෂ්කර කාර්යයන්හි නියැළෙන්නේ දෙවියන්වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහා ය.

මඟුල් පෙරහැර පැවැත්වෙන දිනයෙහි දී විශේෂ කැවුම්, කිරිබත් සකස් කිරීම චාරිත්‍රයක් වශයෙන් සිදුවන්නකි. මෙම කැවිලි සකස් කරනුයේ දේවාලයයේ තේවාකරුවකු වන ගම්පහ විදානේ ය. පෙරහැර පටන් ගැනීමේ දී "වත බැඳීම" නම් චාරිත්‍රයක් වේ. වත බැඳීම යනු දේවාභරණ ගෙන යන ඇතු පිට වස්ත්‍ර ඇතිරීම ය.

## ගායන හා වාදන අවස්ථා:-



ඇසළ පුරපසළොස්වක ගෙවී අවපෑළවිය ලබන දිනයේ දී "වේගවත් පෙරහැර" නමින් හැඳින්වෙන විශේෂ පෙරහැරක් පැවැත්වේ. දුවන පෙරහැර යනු මෙයට තවත් නමකි.

මෙම පෙරහැර මහා දේවාලයයෙන් නික්ම වල්ලි අම්මා දේවාලයය වෙත යයි.

මෙහි දී විශේෂ හේවිසි වාදනයක් දැකිය හැකිය. නිලධාරීන් ඉදිරියේ පැවැත්වෙන හේවිසි වාදනයේ දී වාදනය කරනු ලබන්නේ එම අවස්ථාවට පමණක් සැකසුණු බෙර පදයකි. මෙම බෙර පදය නම් කර ඇත්තේ "වීරපදය" නමිනි.

හේවිසි වාදනය මෙන් ම, දමිළ බෙරය නාගස්වරම් ආදි භාණ්ඩ වාදනය කිරීම මෙම පෙරහැරේ දැකිය හැකි ය. ඊට අමතර ව දේශීය වාද්‍ය භාණ්ඩ ද භාවිත කෙරේ. දෙවියන් වැඩම කිරීම සිදු කරන්නේ මහා දේවාලයයෙන් ලබාගත් පිරිත් පැන් දේවාලයය පුරා ඉසීමෙන් හා දේවාලයය තුළ තැන්පත් කිරීමෙන් අනතුරු ව ය. එහි දී ''හරෝ හරා'' නාදයෙනුත් තූර්ය වාදන, ඝණ්ටා හා සීනු නාදයෙනුත් අවට පරිසරය ගිගුම් දෙයි.

පෙරහැර එළිය කරන පන්දම්කරුවන් ද, සුවඳ දිය සහ මල් ඉසින්නන් ද, මාර්ගය පවිත්‍ර කිරීම පිණිස කහ දියර ඉසින්නන් ද, ස්තෝත්‍ර සහ ද්‍රවිඩ ගීතිකා ගායනය කරන්නන් ද, පෙරහැර දෙපසින් ගමන් කරනු දැකිය හැකි ය. මෙහි දී සිංහල හා ද්‍රවිඩ ජනතාවගේ එකමුතුකම ද පෙනේ. මෙහි දිස් වන්නේ රජ පෙරහැරක ස්වරූපයකි. ඊට හේතුව රජ පෙරහැරක ඇතුළත් වූ සෑම අංශයක් ම මෙම දේවාල පෙරහැරෙහි අන්තර්ගත ව තිබීම ය.

## නර්තන රංග වස්ත්‍ර හා සැරසිලි:-



පෙරහැරෙහි වැඩමකරවනු ලබන ශුද්ධ වස්තු, යන්ත්‍ර හා දේවරූප, වාසනාමේදිය වෙත ගෙන යනුයේ කපුරාල ය. දේවාලයේ සිට මේදිය තෙක් වූ මාර්ගය රතු පලසක් වැනි පාවාඩයකින් සහ සුදු වියනකින් සැරසීමත්, ශුද්ධ වස්තූන් ගෙන යන කපුරාල මුඛවාඩමකින් හා තලප්පාවකින් සැරසීමත් මේ අවස්ථාවේ දී දැකගත හැකි ය.අලි ඇතුන් ගෙන් මෙන් ම විදුලි බුබුළුවලින් හා වීදි සැරසිලිවලින් පෙරහැර අලංකාර වෙයි.

පෙරහැරේ ඉදිරියෙන් ම සිටින්නෝ ඉර හඳ නිරූපණය කෙරෙන සිංහල ඡත්‍ර, සේසත් දරන්නන්, හා දිසා කොඩි දරන්නෝ ය. පෞරාණික නියමයන් අනුව තම තමන්ට නියමිත කොඩි ඔසවා ගත යුත්තේ නින්දගම් ලද්දවුන් විසිනි. ඊළඟට නිලමේ ඇඳුමෙන් සැරසුණු බස්නායක නිලමේ සහ දේවාලයයේ ලේකම්වරයා දැකිය හැකි ය. ඔවුන් දෙදෙනා දෙපස කපුරු සහ පහන් අතැති හේවා කරුවෝ දෙදෙනෙක් සිටිති. දෙවියන් වැඩම වන ඇතුපිට මුඛවාඩමින් සැරසුණු කපුරාල ය. දෙවියන්ගේ ආරක්ෂාවට මෙන් එසේ ගමන් කරනුයේ මහ දේවාලයයෙහි සේවාව කරන ප්‍රධාන කපුරාල යි. ඇතු පිටුපසින් අත්වැල් බැඳගත් ''ආලත්ති අම්මලා'' ගමන් කරති.

උඩරට, පහතරට හා සබරගමු ආදි සාම්ප්‍රදායික නර්තන අංග මෙන් ම කුලූ, ගොයම්, රබන්, සවරන්, චාමර, වේවැල්, තාලම්, ලී, කඩු ආදි විවිධ ගැමි නැටුම් වලින් ද සිංහ නැටුම, හනුමන්තා නැටුම, මොනර නැටුම ආදි නිර්මාණ නැටුම්වලින් මෙම පෙරහැර අලංකාරවත් වේ. ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි කාවඩි නැටුම, කෙහොඹ කළය ආදි නැටුම් මෙම පෙරහැරෙහි සුවිශේෂ වේ. සාම්ප්‍රදායික බෙර වාදන ඇඳුම් කට්ටලය හා සාම්ප්‍රදායික නර්තන ඇඳුම් කට්ටල ද භාවිත කරන අතර විවිධ ආකාරයට නිර්මාණය කරන ලද රංග වස්ත්‍රාභරණ ද නැටුම් සඳහා භාවිත කරනු දක්නට ලැබේ. ගායනය, වාදනය හා නර්තනය සඳහා ස්ත්‍රී, පුරුෂ දෙපිරිස ම සහභාගි වෙති.





**පැවරුම:-**

- **වගුව ඇසුරු කර ගනිමින් හිස්තැන් පුරවන්න.**






| | |
|---|---|
| පැවැත්වීමට හේතු:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... | පැවැත්වෙන කාල සීමාව:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... |
| පෙරහැරෙහි දක්නට ලැබෙන නර්තන අංග:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... | පෙරහැරෙහි දක්නට ලැබෙන වාදන භාණ්ඩ:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... |
| පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ පුද්ගල නාම:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... | පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ චාරිත්‍ර විධි:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... |
| පෙරහැරෙහි දක්නට ලැබෙන සැරසිලි අංග:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... | භක්තිය දැනවීම සඳහා කරන කාර්ය:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... |
| ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි නර්තන අංග:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... | ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි වාද්‍ය භාණ්ඩ:-<br><br>1)...............................................................<br>2)...............................................................<br>3)............................................................... |

- කතරගම පෙරහර පිළිබඳ තොරතුරු, රූපසටහන් ඇතුළත් කරමින් පොත් පිංචක් සකස් කරන්න

(පත්තර, සගරා, අන්තර්ජාලය ඇසුරෙන් තොරතුරු එක්රැස් කරන්න.)

## පාඩම:-06

# ❖ කරගම් නර්තනය හා කාවඩි නර්තනය

## කරගම් නර්තනය





ඉන්දියාවේ ගැමි නැටුම් අතරින් සුවිශේෂ වූ ගැමි නැටුමකි.තමිල්නාඩු ප්‍රාන්තය මූලික කර ගෙන මෙහි ආරම්භය සිදු වූ අතර තාන්ජාවූර් ප්‍රදේශයේ ආගමික පුද පූජා අවස්ථාවන්හි දී දක්නට ලැබේ.

### පුද ලබන දෙවිවරු:-

මාරි අම්මාන් හා ගංගා අම්මාන් දෙවිවරු
උත්සව පවත්වන කාල සීමාව
අගෝස්තු මාසය තුළ ඉන්දියාවේ හා ලංකාවේ
පැවැත්වෙන උත්සවයකි.



SAMAYAPURAM MARIAMMAN

## කරගම් නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ:-

- සමබරතාව තබා ගනිමින් නර්තනය කිරීම මෙහි විශේෂත්වයකි.
- කළයක් හිස මත තබා ගෙන සරල චලන භාවිතයට ගනියි.
- ගැහැනු පිරිමි දෙපක්ෂය සහභාගි වේ.
- තනි තනි ව හා යුගල වශයෙන් නර්තනයේ යෙදෙති.
- ලෝහවලින් හෝ මැටිවලින් හෝ සකස් කරන ලද කළය විවිධ වර්ණයෙන් යුත් මල් වර්ගවලින් සරසනු ලැබේ.
- උදා : රතු, සුදු, කහ මල් වැඩි වශයෙන් අලංකාරය සඳහා යොදා ගැනේ.
- කළය මුදුනේ කඩදාසිවලින් සකස් කරන ලද ගිරවකු ගේ ආකෘතියක් නිර්මාණය කර ඇත.
- එම ගිරවා කැරකෙන ආකාරයට කළය හිස මුදුනේ තබා ගැනේ.
- සමබරතාව පවත්වා ගැනීම සඳහා කළය ඇතුළට සහල් දමනු ලැබේ. මල්වලින් සරසන ලද කළයේ කවාකාර බව ඉස්මතු කිරීමට බම්බු ලීයක් කළය තුළට සිරස් අතට දමා එය වටා මල් වැල්වලින් අලංකාර කර නර්තනයේ චමත්කාර බව වැඩි කර ගැනේ.

### සංගීතය හා වාද්‍ය භාණ්ඩ:-

බෙර වර්ග හා නළා වර්ග සංගීතය සඳහා යොදා ගන්නා අතර නෛයඩි මේලම් සංගීතය මෙහි දී සුවිශේෂ වේ. ඇතැම් විට ගායනය සඳහා ගීත ද යොදා ගැනේ.

### රංග වස්ත්‍රාභරණ:-

දමිළ ලක්ෂණ පෙන්නුම් කරන සාරිය නොහොත් දිග සාය, හැට්ටය හා ආභරණ කාන්තාවන් භාවිත කරන අතර පිරිමි දෝතිය හා පූන නූල භාවිත කිරීම දක්නට ලැබේ. රතු, කහ, කොළ වර්ණ වැඩි වශයෙන් යොදා ගනු ලැබේ.

### කාවඩි නර්තනය:-



කාවඩි නැටුම මුරුගන් දෙවියන් වෙනුවෙන් කරන භක්ති නර්තනයකි. මුරුගන් කෝවිල් ආශ්‍රිත ව දියුණු වූ ජන කලාවක් වන කාවඩි නර්තනය වතුකරයේ ද බහුල වශයෙන් පවත්වනු දක්නට ලැබේ.

කාවඩි වචනය නිර්මාණය වී ඇත්තේ ''කාවතඩි'' යන පදයෙනි. කාව යනු ඔසවන යන අරුත දෙයි. තඩි යනු කෝටුව යි. ඒ අනුව ඔසවාගෙන යන කෝටුව යන අරුත කාවඩි යන පදයෙහි ගැබ් ව ඇත. මුරුගන් දෙවියන් සඳහා පූජා භාණ්ඩ රැගෙන ගිය කද සිහිපත් කරමින් කාවඩිය නිර්මාණය වී ඇති බව කියැවේ. කාවඩි වර්ග කිහිපයකි;

- කිරි කාවඩි
- භක්ති කාවඩි
- පරවි කාවඩි
- මත්ස්‍ය කාවඩි
- ගිනි කාවඩි

**සංගීතය හා වාද්‍ය භාණ්ඩ:-**

තවිල් බෙරය හා නාගස්වරම් යන භාණ්ඩවලට සමාන භාණ්ඩ වාදනය සමග මුසු කර ගන්නා සංගීතය පදනම් කර ගනිමින් කාවඩිය සමබර ව තබා ගනිමින් තම විවිධ දක්ෂතා පෙන්වමින් නර්තනය කෙරෙයි.

මේ සඳහා වැඩි වශයෙන් දායක වන්නේ පුරුෂ පක්ෂයයි. භාර භාර ඔප්පු කිරීම සඳහා නර්තනය කරන අතර අවසානයේ දානයක් දෙනු ලබයි. කාවඩි නර්තනයේ ද සරල ඇඳුම් මෙන් ම සරල පද යොදා ගැනීම දැකිය හැකි. කාවඩි නිර්මාණය කර සැරසිමේ දී මොණර පිහාටු භාවිතා කරයි.

## පැවරුම:-

- හිස්තැනට අදාල නිවැරදි පිිිිිිිළිතුර යොදා පහත ඡේදය සම්පූර්ණ කරන්න.

ඉන්දිය ගැමි නර්තන අතුරින් මුරුගන් දෙවියන් උදෙසා සිදුකරන .................................. නර්තනය හා .................................. දෙවියන් උදෙසා කරගම් නර්තනය සිදුකරනු ලබයි. කරගම් නර්තනය.................................. මාසයේ .................................. ප්‍රදේශයේ ආගමික පුද පූජා අවස්ථාවන්හි දී දක්නට ලැබේ. මෙම නර්තනය සඳහා සරසන ලද .................................. යොදාගනි එහි මුදුනේහි .................................. ආකෘතියකි.

කාවඩි නර්තනය සඳහා .................................. පිලකින් සරසන ලද .................................. රංග උපකරණය ලෙස යොදා ගනු ලබයි.................................. සංගීතය කරගම් නර්තනය සඳහා යොදා ගන්නා අතර කාවඩි නර්තනය .................................. හා .................................. වාද්‍ය භාණ්ඩ මුසු සංගිතය අනුව නර්තනය සිදුකරයි. මෙම නර්තනාංග .................................. , .................................. අවස්ථාවන් හිදී දැකිය හැක.

- කරගම් හා කාවඩි නර්තනයට අදාල රංග උපකරණ නිර්මාණය කරන්න.

## පාඩම:-07

# ❖ අත්දැකීම් ඇසුරු කරගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණය

## <u>අද වෙස්සන්තර රාජ පුතා ගීතය</u>

මෙම ගීතය ඇතුළත් වී ඇත්තේ වෙස්සන්තර ජාතක කථාව ඇසුරෙන් නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් විසින් රචනා කරන ලද වෙස්සන්තර නූර්ති නාට්‍යයේ ය.


මෙය වෙස්සන්තර හා මන්ද්‍රී දේවියගේ විවාහය තේමා කරගනිමින් ගායනා කරනු ලබන නූර්ති ගීතයකී.

පද රචනය : නීතිඥ ජෝන් ද සිල්වා සූරීහු

ගීත ගායනය : ජෝන් ද සිල්වා නාට්‍ය කණ්ඩායම



අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රී කුමාරි බඳී
දේවෝපකාරේ වේවා සෑදී සෙත්
රටවැස්සන්ගේ කාලෙ හොඳා
දුර්භික්ෂ යාය සිඳී
මංගල්ලේ සාරවෙවා සෑදීසෙත්
බෝම ප්‍රීති ඝෝෂා ඇසෙන්නා මේ සිව් දිසා
සෙත අත්පත් වේවා මන්ද්‍රි කුමරිහට දැන්
රාජ සම්පත් නොමින් දේය රාජා උතුම්
කුමරාගේ පිනක් මයි
වාසනා බෝ........... වාසනා බෝ



## වෙසක් කැකුළු ගීතය




සරල පද රචනයෙන් මෙන් ම ගී තනු සරල බවින් ද යුත් මේ ගීතය ඇතුළත් වන්නේ

චිත්‍රපට සංගීතයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන 1956 නිෂ්පාදනය වූ 'රේඛාව' නම්

චිත්‍රපටියේ ය.

පද රචනය : මර්සලීන් ජයකොඩි පියතුමා

සංගීත නිර්මාණය : තනු නිර්මාණය - සුනිල් සාන්ත මහතා

සංගීත නිර්මාණය - බී.ඇස්. පෙරේරා මහතා

ගීත ගායනය : ඉන්ද්‍රාණී විජේබණ්ඩාර මහත්මිය

වෙසක් කැකුළු අතු අග ඉද නටන විලාසේ

ඉරෙන් හඳෙන් සිරි විද විද රඟන විලාසේ //

පියලි සලාලා රේණු සලාලා සුවඳ උරා සිසිල් සුළං හමන්නේ

ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ //

දවට ගහේ ගහ මුදුනේ කොහා අඬන්නේ

කෑරලා ද නාද දෙමින් ගහට කොටන්නේ //

ටිං ටිං සද්දේ ඒ මැද ඇත්තේ

ගම වට කර කුරුලූ ගීත ඇසෙන්නේ

ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ//

කදා වළලූ දෑත දිගේ ටිකිරි ලියන්නේ

ටිකිරි ටිකිරි වළලූ හඬ යි ළපටි ළඳුන්ගේ//

ගීත ගයන්නේ ගයා නටන්නේ

කොලූ කෙලි පොඩි ගී ගයමින් නටන්නේ

ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ //



## පැවරුම:-

1. මෙම ගීත දෙක හොඳින් ශ්‍රවණය කරන්න.
2. මෙම ගීත ශ්‍රවණය කිරීමේ දී ඔබ සිතට දැනුණු අදහස් දෙකක් ලියන්න.
3. දවට ගහමුදුනේ සිට හඬන පක්ෂියා නම් කරන්න.
4. එම පක්ෂියාගේ නාදය ඇපට ඇසෙන්නේ ....................................... කාලයේ දී ය.
5. ගීතයට අනුව ''ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ'' කුමන හේතු නිසා ද?
6. වෙස්සන්තර නූර්ති නාට්‍යය රචනා කරන ලද්දේ කුමන ජාතික කථාව ඇසුරු කර ගනිමින් ද?

- **යා කරන්න.**

| | |
|---|---|
| වෙසක් කැකුළු ගීත ගායනය | මර්සලීන් ජයකොඩි පියතුමා |
| වෙස්සන්තර නාට්‍ය | ඉන්ද්‍රාණී විජේබණ්ඩාර මහත්මිය |
| ගීත රචකයෙකි | වෙස්සන්තර කුමරු මන්ද්‍රි කුමරි |
| චරිත දෙකකි | නීතිඥ ජෝන් ද සිල්වා මහතා |

- **ගීතයට අනුව නර්තන නිර්මාණය**

1. දැන් ඔබ කැමැති පරිදි මේ ගීත දෙකෙන් එකක් තෝරා ගන්න.
2. තනි ව ම හෝ තෝරා ගත් ගීතයට චලන නිර්මාණය කරන්න.
3. පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් නර්තනය නිර්මාණය කරගන්න.
4. ගීතයේ අදහසට අනුව හෝ ඔබ කැමති ආකාරයට හෝ චලන නිර්මාණය කරගන්න.
5. සංගීත ඛණ්ඩ සඳහා ද සුදුසු චලන යොදා ගනිමින් නර්තනය අලංකාර කරගන්න.
6. ගීතයේ අදහසට අනුව චලන යොදා ගැනීමේ දී මුහුණේ ඉරියවු කෙරෙහි ද අවධානය යොමු කරන්න.
7. චලන නිර්මාණය කිරීමේ දී පාසලට ගැළපෙන ආකාරයට චලන සකස් කර ගැනීමට සැලකිලිමත් වන්න.
8. අවකාශ භාවිතයේ දී දිසා, තල, රටා පිළිබඳ අවධානය යොමු කරන්න.
9. ඔබගේ නිර්මාණ ඉදිරිපත් කරන්න.